# රූ දෙස් සංචාරකයන්ට අත වනන 'කිතුල්ගල කුරුළු පාරාදීසය'



**කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධන රටවල් බවට පත්වී ඇති යුරෝපයේ සෑම රටකම පාහේ සංවර්ධනයේ පිරිවැය බවට පත්වී ඇත්තේ ස්වාභාවික පරිසරය යි. සියලු වනාන්තර විනාශකර කම්හල් හා කාර්මික නගර ඉදිවූ එබඳු රටවල ජනතාවට ස්වාභාවික පරිසරය වෙනුවට අද දැකිය හැකිවන්නේ කොන්ක්‍රීට් වනාන්තර පමණි.**

යූ. පී. එස්. පතිරණ


මෙබඳු ඒකාකාරී පරිසරයක දිවි ගෙවීමට සිදුවීමෙන් මානසික පීඩනයට පත්වන යුරෝපයේ බොහෝ ජනයා වසරකට එක් වරක් හෝ එම ඒකාකාරී පරිසරයෙන් මිදීයාමට අනිවාර්යෙන්ම ඔවුන්ගේ වාර්ෂික විවේක නිවාඩුව ගත කිරිම සඳහා ස්වාභාවික පරිසරය තවමත් ඉතිරිව ඇති තුන්වන ලෝකයේ රටවල් තෝරා ගනිති.

වත්මනෙහි සංචාරකයන් සොබා සංචරණය (Nature Tourism) හා රූදෙස් සංචරණය (Eco Tourism) කෙරෙහි වැඩි නැම්යාවක් දක්නට ලැබීම මෙහි එක් ප්‍රතිඵලයෙකි. මෙහිදී ස්වාභා-වික පරිසරයන් විශේෂයෙන් ගංගා ඇළදොළ දිය ඇලි කඳුවැටි හා වනපෙත් සොයා ඇදෙන සංචාරකයන් පක්ෂීන් නිරීක්ෂණය කිරීමට වඩාත් යොමුවීම ද සංචරණයේ නව ප්‍රවණතාවක් බවට පත්වී තිබේ.

පක්ෂී නිරීක්ෂකයන් (Birders) වශයෙන් පැමිණෙන සංචාරකයන් කුරුල්ලන් විශාල වශයෙන් ගැවසෙන වනපෙත් ඇතුළු පරිසර පද්ධතිවලට වැඩි අවධානයක් යොමුකරනු දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ පක්ෂීන් නිරීක්ෂණය කළ විශේෂ පරිසර පද්ධති කිහිපයක් වේ. ඒ අතර, යටියන්තොට ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ හෙක්ටයාර් 17 1/2 ක පමණ භූමි ප්‍රමාණයක් වෙන්කර ඇති කිතුල්ගල කුරුලු පාරාදීසය අද විදේශ සංචාරකයන්ගේ (පක්ෂී නිරීක්ෂකයන්ගේ) ප්‍රධාන ආකර්ෂණයක් බවට පත්වී තිබේ.


මෙම සුවිශේෂී කුරුලු පාරාදීසය පිහිටා ඇත්තේ කොළඹ ගිනිගත්හේන මහා මාර්ගයේ කොළඹ සිට කි.මි. 90 ක පමණ දුරකින් පිහිටි කිතුල්ගල ලංකා හෝටල් සංස්ථාවට අයත් නානායම පිටුපසිනි. මාකන්දව නමින් වඩාත් ප්‍රකට මෙම වනපෙත වෙත ළඟාවීමට කිතුල්ගල නානායම පිටුපස පිහිටි කැළණි ගඟින් එගොඩ විය යුත්තේ ඔරුවකිනි. කැළණි ගඟින් එගොඩවීම සඳහා නිරන්තර ඔරු සේවාවක් ක්‍රියාත්මක







වන හෙයින් දිවා කාලයේ කවර වේලාවක වුවද කැළණි ගඟින් එගොඩ වී මෙම වනපෙතට ලඟාවීමට කිසිදු අවහිරයක් නොමැත. සබරගමුව පළාත් සංචාරක අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් දැනටමත් සංචාරක ව්‍යාපෘතියක් වශයෙන් සංචාරකයන් සඳහා පහසුකම් සැලසීමට පියවර ගෙන ඇති කිතුල්ගල කුරුලු පාරාදීසය ඇත්තෙන්ම සොඳුරු පරිසරයකි. කොස්ගොඩ තුතිලැලි කම්හල ඉදිකිරීමත් සමග එයට අවශ්‍ය ලී දඬු ලබාගැනීම සඳහා එළි පෙහෙලි වූ තෙත් කලාපයේ ප්‍රාථමික වනාන්තරවලින් එක් වනපෙතක් වූවේද මෙම මාකන්දව වනපෙතයි. මීට අමතරව දේශපාලන බලය ද තිබූ අතර හොර දැව ජාවාරම්කරුවන්ගෙන් ද කිසිදු අනුකම්පාවක් නොලත් මෙම වන පියස අද ද්විතියික වනාන්තරයක් වශයෙන් හෝ ඉතිරිවී පැවතීම ද හාස්කමෙකි. මෙම වනපෙත බණ්ඩාර කැලේ නමින් ද ප්‍රදේශයේ ජනතාව අතර හැඳින්වේ.



මාකන්දව වනපෙත තුළින් ගලා බසිමින් කැළණි ගංගාව පෝෂණය කෙරෙන එක් අතු ගංගාවක් මෙම වනපෙත තුළ දර්ශනීය දියඇලි කිහිපයක් හා නාන තොටුපල කිහිපයක් බිහිකිරීමට සමත් වී තිබේ. මෙහි එක් වැදගත් දිය ඇල්ලක් වනුයේ මකුළු ඇල්ල යි. මකුළු දැලක ආකාරයට අඩි 150 ක පමණ ඉහළ සිට ජලකඳ කඩා හැලෙන මකුළු ඇල්ල මෙම වනපෙතට මහත් අලංකාරයක් ලබා දී තිබේ. බොහෝ විට ප්‍රාථමික වනාන්තරයක ස්වභාවය උසුලන මෙම ද්විතියික වනාන්තරය තෙත් කලාපීය සදහරිත වනාන්තරයක දැකිය හැකි සියළු අංග ලක්‍ෂණයන් ගෙන් සමන්විත වී තිබේ. මෙම වනයේ ශාක ප්‍රජාව ගැන සැලකීමේ දී ආර්ථික වටිනාකමෙන් යුතු දැව ශාකවල සිට ඖෂධීය වටිනාකමෙන් යුතු පැළෑටි දක්වා ශාක ගහනයන් හඳුනාගත හැකි ය. මෙම වනපෙතේ බහුලව දක්නට ලැබෙන ශාක අතර ඇටඹ, දවුල්කුරුඳු , කොහොඹ, දියගොඩපර, පිහිඹිය, මිල්ල, කටුකිතුල, සූරියමාර, කැකුණ, හවරිය නුග, රුක්අත්තන යන ශාක ඇතුළත් වී තිබේ. මෙම ශාක අතර ශ්‍රී ලංකාවට ආවේණික ශාක 25 ක් පමණ ද හඳුනාගෙන තිබේ. මීට අමතරව කුඩුම්රිස්ස, පෝටා, තිත්ත, ගිරිතිල්ල, හිඟුරු, පුස්වැල්. ආදී වැල් වර්ග මෙන්ම කැප්පෙටියා, සේර, පිනිබරු, එරමිණියා වැනි පඳුරු ශාක ද මහ හැඩයා, කුඩා හැඩයා, වනරාජ, බිං කොහොඹ වැනි ඖෂධීය පැළෑටි ද වනපෙත පුරා පැතිර පවතී.

ජෛව විවිධත්වය පිළිබඳව ද කිසිදු අවතක්සේරුවකට ලක් කළ නොහැකි මෙම වනපෙත තුළදී වල් ඌරා. හාවා, හිවලා වැලි මුවා, ඇයා, පොතු ඇයා, කැලෑ බළලා, හෝතඹයා, ඉත්තෑවා, කබල්ලෑවා, කලවැද්ද, දඬුලේනා, තලගොයා, හිකනලා හා කටුසු විශේෂ කිහිපයක් ද හමුවේ.කුඩැල්ලන් විසින් නිසි ස්වාභාවික ආරක්ෂාව සලසා ඇති මෙම වනපෙත තුළට ඇදි එන සංචාරකයන් සංඛ්‍යාව යම් ආකාරයක සීමා කිරීම මගින් පාරිසරික තුල්‍යතාව රැකීම පිණිස මෙහිදී කුඩැල්ලන් විසින් මහගු සේවාවක් ඉටුකරනු දක්නට ලැබේ.

මෙම මාකන්දව බණ්ඩාරකැලේ වනපෙත විශේෂයෙන්ම වැදගත් වන්නේ කුරුල්ලන් හා සමනලයින් නිරීක්ෂණය කළ හැකි තෝතැන්නක් ලෙසිනි. ශ්‍රී ලංකාවේ නේවාසික පක්ෂීන් බහුතරයක් මෙන්ම සංක්‍රමණික පක්ෂීන් විශාල සංඛ්‍යාවක් මෙම වනය තුළදී නිරීක්‍ෂණය කිරීමට හැකිවීම නිසාම විශේෂයෙන් මෙම කුරුලු පාරාදීසය වෙත ඇදෙන විදේශීය පක්ෂි නිරීක්ෂකයන්ගේ සංඛ්‍යාව වර්ෂයකට 2000 කට වඩා ඉක්මවා යයි. මෙහිදී නිරීක්ෂණය කළ හැකි ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් අතර හබන් කුකුළා, වලිකුකුළා, රතු මුහුණැති මල් කොහා, දුඹුරු සරටුකුස්සා, දුඹුරු කැලෑ බස්සා, ලංකා මලිත්තා, ලංකා පිලලිච්චා, ලංකා කැහි බෙල්ලා, ගිරා මලිත්තා ප්‍රමුඛත්වයක් ගනී. විශේෂයෙන් විදේශ සංක්‍රමණික පක්ෂීන් විශාල සංඛ්‍යාවක් එබඳු කුරුල්ලන් ශ්‍රී ලංකාව කරා ඇදී එන කුරුලු සංචාරක සමය තුළ (සැප්තැම්බර් - අප්‍රේල් කාලය අතර) දැක බලාගත හැකි ය. සමනලයින් නිරීක්ෂණය කිරීම සඳහා ද මෙම කිතුල්ගල කුරුලු පාරාදීසය සංචාරකයන් අතර ප්‍රකට ය. ශ්‍රී ලංකාවට ආවේණික හා විරල ගණයේ සමනල විශේෂ 35 ක් පමණ මෙහිදී නිරීක්ෂණය කළ හැකි බවට ගණන් බලා තිබේ.

කිතුග්ගල මෙම කුරුලු පාරාදීසය ආසන්නයේ සංචාරකයන් ඇද බැඳ තබා ගනු ලබන සංචාරක ආකර්ශණ රැසක් ද ඇති බව මෙහිදී අමතක නොකළ යුතු නොවේ. ක්වායි ගඟේ පාලම නම්වූ සුප්‍රකට ඉංග්‍රීසි චිත්‍රපටය සඳහා පසුතලය මැවූ ස්ථානය ඇත්තේ කිතුල්ගල කැළණිගඟ ඉස්මත්තේ ය. ආදී මානවයන් විසූ බෙලිලෙන හා දර්ශනීය ඕලූ ඇල්ල ද කිතුල්ගල චාරිකාවේ යෙදෙන ඔබට අනිවාර්යයෙන් ම නැරඹිය යුතු ස්ථාන ලෙස සඳහන් කළ යුතුය. ඔරුවෙන් කැළණි ගඟ තරණයකර දැරණියගල දක්වා පයින් යාහැකි ගමන් මාර්ගයක් ද මෙම බණ්ඩාරකැලේ හරහා වැටී ඇති නිසා මෙහි ජනයා නිතර එහාමෙහා යන හෙයින් කිතුල්ගල කුරුලු පාරාදීසයට ඇතුළුවන සංචාරකයන්ට එතරම් හුදකලා බවක් ද ඇති නොවේ. ත්‍රාසතරණය(Adventure) සඳහා පැමිණෙන සංචාරකයන් ඩිංගි බෝට්ටු මගින් ගඟ දිගේ ඇති බාධක පරද සුදු පෙණරැළි මගින් (White Water Rafting) කැළණි ගඟ දිගේ පහළට ගමන්ගන්නා ආකාරය ද කිතුල්ගල දී දැක බලාගත හැකි අපූර්ව දර්ශනයකි. කිතුල්ගල කුරුලු පාරාදීසය වෙත ඇදෙන සංචාරකයෙකුට කිතුල්ගල තානායම ඉදිරිපිට සවිකර ඇති පැරණි දැන්වීම් පුවරුව ද අමුතුම ආකාරයේ සිහිවටනයක් වනුඇත. එම පුවරුවේ එවක කැළණි ගඟේ පාරුවෙකින් අශ්වයන් ගොනුන් අදිනු ලබන වාහන හා මගීන් එගොඩ කිරීම සඳහා අය කළ ගාස්තු සටහන් කර තිබේ. ඒ අනුව මගීන් ගෙනයන තනි අශ්වයා අදින සෑම වාහනයකට සහ පදවන්නාට හා මගීන්ටත් සමග රෝද දෙකේ එකකට ශත 50 යි. රෝද හතරේ එකකට ශත 60 යි. මගීන් ගෙනයන අශ්වයන් දෙදෙනකු යොදන ලද සෑම වාහනයකට ම සහ එය පදවන්නාට හා මගීන්ට රුපියල් 1 යි. එහි යොදන ලද හෝ එය සමඟ ගෙනයන සෑම අතිරේක අශ්වයෙකුට ශත 10 යි. තනි ගොනා බඳින ලද සෑම වාහනයකට එය පදවන්නාට සහ මගීන්ට ශත 30 යි. ඒ සමඟ ගෙනයන ගොනෙකුට ම ශත 10 යි. ආදී වශයෙන් සටහන් කර තිබේ.

පක්ෂීන් නිරීක්ෂණය සඳහා කදිම පරිසරයක් මවන කිතුල්ගල කුරුලු පාරාදීසය හැටියට දැනටමත් නම්කර ඇති මෙම මාකන්දව හෙවත්, බණ්ඩාරකැලේ වනපෙතට ද වර්තමානයේ ලංකාවේ අනෙකුත් පරිසර පද්ධති වලට පොදුවේ බලපාන පාරිසරික ගැටළු අභිබවා යාමට නොහැකි වී ඇති බවද අවසාන වශයෙන් සඳහන් කළ යුතුව ඇත. නීති විරෝධී දැව සංහාරය කැලෑ හෙළි කිරීම පමණක් නොව, විශේෂයෙන් ශ්‍රී පාද වන්දනා සමය තුළ කැළණි ගඟේ දිය නෑමටත් ඉන් නොනැවතී කුරුලු පාරාදීසය නැරඹීමටත් ඇදී එන දේශීය සංචාරකයන් ගේ අසංවර හැසිරීම් රටාව මෙන්ම වනපෙතේ නිහඬතාවය බිඳ දමමින් කෙරෙන ශබ්ද දූෂණය ද මෙම කැලයේ වටිනා පැළෑටි ආදිය ඉවත් කර ගෙන යාමද මෙම රක්ෂිතයේ තිරසාර පැවැත්මට දැනටමත් තර්ජනයක් වී තිබේ.

❑